39 වන පිටෙන්

එක්විය. ඔහුගේ අවමංගල කටයුතු වලට සහභාගී වූ මාලනී නැන්ද සමඟ තවත් අපේ රටේ අසහාය කලාකරුවකු වන ධර්මසිරි බණ්ඩාරනායකයන්, 'තරු අය්යගේ හිරු අවරට ගියාදෝ' නාට්‍යය මතක් වෙනකොට අදත් අඟේ ගිරි ගඩු පිපෙනවා'' කියමින් කල සංවාදය මා හට අශ්චර්යයක් ගෙන දුණි. මා ලොවට උපත ලබාවත් නැති යුගයක මාගේ පියා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයක් පිළිබඳ අද දින මේ යුගයේදීත් එවන් ප්‍රවීනයකුගෙන් අසන්න ලැබීම මාගේ භාග්‍යයක් ලෙස මම විශ්වාස කරමි. අප්පච්චීගේ මේ නාට්‍ය වලින් තවත් ප්‍රවීන කලාකරුවන් රැසක් ඔවුන්ගේ මුල්ම රංගනයෙන් මේ ක්ෂේත්‍රයට අවතීර්ණය වී ඇත. ඒ අතර සතිස්චන්ද්‍ර එදිරිසිංහ, සොමී රත්නායක, චන්ද්‍රා කලුආරච්චි, ගායක එඩ්වඩ් ජයකොඩි හා සමානවම මහාචාර්ය්‍ය සුනිල් ආරියරත්නයන් පවා මුල් යුගයේ වේදිකා පරිපාලනයෙන් මාගේ පියාගේ නාට්‍යවලින් පන්නරය ලබුවෝ වෙති.

ඔහුගේ නාට්‍ය නාමාවලියට ඊළඟට එකතුවන්නේ 'ටික්කි ටිකිරි ලියා' (පරිවර්තන) 'ගඟට උඩින් කොක්කු ගියෝ', 1968 - 'මල කෝලං' මෙම නාට්‍ය 2007 දී ඕස්ට්‍රේලියාවේ දී නව නිශ්පාදනය කල අතර, 1966 'පයිප්පේ' එහි නව නිශ්පාදනය 70 දශකයේ දී 'සත්මහල් ප්‍රාසාද', 60 දශකයේ 'ගඟට උඩින් කොක්කු ගියෝ' නව නිශ්පාදනය, 80 දශකයේ දී ''අවුරුදු 80කට පස්සේ 'සිංහ පුරාණය', 1984 'කලිගියුලා' - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් මෙම නාට්‍යය නරඹා, අප්පච්චීට එවා තිබූ ලිපියක මෙසේ සඳහන් විය.

'S. කරූ ලියා නිෂ්පාදනය කල 'කලිගියුලා' නාට්‍ය මම නැරඹීමි. මෙය ඉතාම විශිෂ්ට නිෂ්පාදනයක් ලෙස මම අගය කරමි.'

අප්පච්චිගේ නාට්‍ය වලට අමතරව, අන් අය විසින් නිෂ්පාදනය කර ඔහු රඟපෑ නාට්‍ය අතරට 'රං කූඩුව', 'අතරමං වූවෝ', 'දෝන සුමනාවතී', 'අවිනිශ්චිත', 'හඳහන්' හා 'නිදිකුම්බා' වැනි නාට්‍ය සඳහන් කළ හැකිය.

ඔබ අප කවුරුත් දන්නා ටයිටස් තොටවත්තයන් සමඟ කාලයක් චිත්‍රපට ක්ෂේත්‍රයට සම්බන්ධ වූ මගේ පියා සිහසුන, මංගලා, සාගරිකා වැනි චිත්‍රපට සහය අධ්‍යක්ෂණය කර ඇත.

1984 කලිගියුලා (පරිවර්ථන) නාට්‍යයෙන් පසු 1996 මහ බැංකුවෙන් විශ්‍රාම යනතුරු ඔහුගේ නිහැඬියාවක් නාට්‍ය ක්ෂේත්‍රය තුල ඇති වන්නේ ඔහුගේ වචනයෙන් කියනවා නම් කුටුම්භ රක්ෂණය සඳහාය.

70 දශකයේ ඔහුට දූව උපත ලබන දියණිවරුන් දෙදෙනා ඔහුගේ නිදහස් විනෝදකාමී ජීවන රටාවට කිසිසේතම බාධාවක් නොවුනු බව බාල දියණිය ලෙස මට ඉතා විශ්වාසයෙන් ප්‍රකාශ කල හැක. දියණිවරු දෙදෙනෙකු වීමත්, මාගේ ආදරණීය අම්මා මහා පොළවක් සේ සියලු බර කරට ගැනීමත්, අප්පච්චී ඉතාම නිදහස් මිනිසකු ලෙස කලා ලොවට දයාද කර තැබීමට ඉවහල් විය. අපගේ කුඩා කල නිවසේ සමහර සිදුවීම් ඉතාම රසබර නාට්‍යක්ම විය. අද දින ඒ රත්තරං අම්මාත්, අප්පච්චීත් නොමැතිව, ඒ සුන්දර මතකයන් අනුස්මරණය කරමින් අපේ ජීවිත ගෙවා දමනවා ඇරුණු කොට, වෙන යමක් අපට ඉතිරිව නැත.

නැවත වතාවක් 90 දශකයේ අග භාගයේ මාගේ පියාණන් පූර්ණ කාලීනව නාට්‍ය පරිවර්තකයකු ලෙස ක්ෂේත්‍රයේ නියැලෙන්නේ වර්ෂ 1997 මාර්තු 27 දින ශ්‍රී ලංකා මහා බැංකු සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුවය. ඒ වන විට කලා මණ්ඩලයේ නාට්‍ය අනු මණ්ඩලයේ විනිශ්වය මණ්ඩලය නියෝජනය කල මාගේ පියාට 1997 රාජ්‍ය නාට්‍ය උළෙල විනිශ්වය කිරීමේ දී මුණ ගැසෙන තරුණ නාට්‍ය කරුවා බුද්ධික දමයන්ත නම් විය. මීට මාස 03කට පෙර ඔහු මෙලොවින් සමු ගන්නා තුරුම තරුණ නාට්‍යවේදීන් සමඟ ක්ෂේත්‍රයේ වැඩ කිරීමේලා පුරෝගාමී වූයේ නාට්‍යවේදී බුද්ධික දමයන්තය. ඔහුත් සමඟ 1998 'දවස තමා ගෙවුනෙ නෑ' නාට්‍ය එම වසරේ රාජ්‍ය නාට්‍ය උළෙලේ

- හොඳම නළුවා
- හොඳම නිළිය

යන සම්මාන දිනා ගන්නා ගන්නා ලදී. ඔහු සමඟ මගේ පියා 1999 - 'බන්සි මැරිලා නෑ' (හොඳම පරිවර්තනය)
2000 - 'අපේ පංති කාමරය' (හොඳම පරිවර්තනය) 2001 - 'රැකවලා' (හොඳම පරිවර්තනය) 2006 - 'පුංචි කාමරය' (හොඳම නළුවා, නිළිය) 2008 - 'උතුරු කොනට පටු පාරක්' යන නාට්‍ය හරහා වසර 10ක් පමණ නාට්‍ය පරිවර්තනයෙන් සම්බන්ධ විය. මේ යුගයේ ඔහු විසින් පරිවර්තනය කල අන් කලාකරුවන් නිෂ්පාදනය කල නාට්‍ය ගොන්නට 2001 - 'සමාවෙන්න වැරදීමක්' - සුනිල් චන්ද්‍රසිරි,
2001 - 'ක්වීනි' - අනුර ඒකනායක, 2002 - 'දස මල්ලිගේ බංගලාව' ''හයිනා'' චාමික හත්ලහවත්ත, 'තනියෙන් විශිෂ්ටයි - ආලෝක සම්පත්, 'කලු සමනල්ලු', 'මරුදුතියෝ', 'චුටි දූ' මේසා නාට්‍ය ඇතුළු විය. දශක 06 ක් පමණ මෙහි සක්‍රීයව රැඳී සිටීමට මෙම තරුණ නාට්‍යකරුවන් සමඟ සම්බන්ධ වීමද ඔහුට ඉතා සුභවාදී දිවියකට පන්නරයක්ම විය.

මා මුලින් සඳහන් කල අප්පච්චි සටහන් තැබූ කොලයක සඳහන් වූ එයාගේම සටහනකින් මට මේ ලිපියට සමු දෙන්නෙමි.

''අද ප්‍රවීණ නාට්‍ය කරුවකු, නළුවකු, නාට්‍ය නිෂ්පාදන, නාට්‍ය පරිවර්තකයකු ලෙසම ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 35ක සේවයේ නියුතුව විශ්‍රාම ලැබූ දැනට ශ්‍රී ලංකාවෙන් පිටත විදේශගතව දරු - මුණුපුරන් සමඟ අවුරුදු 80කට ආසන්න (78) වයස්ගත දිවියක් ගෙවනු ලබන ....... එස්. කරුණාරත්න නම් වූ ඒ මහා කලාකරුවා හුදකලා දිවියක් ගෙවන්නේය. වරින් වර කිසියම් ආත්මානුකම්පාවකින් ඔහුගේ සිත නිරන්තරයෙන්ම පෙලනු ලබන්නේය. අවසන් ගමන් කණුව වෙතට ඔහු ලං වී ඇත !!! ඔහුගේ ගත, සිත මහත් වූ පහන් සංවේග යකින් වෙලී පැටලී ඇති බවත් මේ මොහොතේ දැන්..........'' (13/07/17) ඇස්. කරූ

සදදරණීය අප්පච්චී ඔබ වන් උතුම් පියකු ලද මා කෙතරම් පිං වන්තද ? යලි කිසිම දිනක අප මුණ ගැසෙන්නේ නැති වෙයි. මා එය ප්‍රාර්ථනා කරන්නේ ද නැත. ඒ ඔබතුමා ඉතාම කෙටි කලකින් මේ සසර ගමන නිමා කරන බැවිනි..........

අප්පච්චි ඔබට සුභ ගමන් !!!


